# චින්තන නිදහස හා ශ්‍රී ලාංකේය සමාජය

GENC-1001.2

ශ්‍රී ලාංකේය සමාජය හා බෞද්ධ සංස්කෘතිය


කුඩාකත්නෝරුවේ විනීත හිමි

(Kudakathnoruwe Vineetha Thero)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# අරමුණු

- ශ්‍රී ලාංකේය සමාජ හා එහි සංයුතිය හඳුනාගැනීම
- චින්තන නිදහස යන සංකල්පය හඳුනාගැනීම
- පැරණි ශ්‍රී ලාංකේය සමාජයේ චින්තන නිදහස
- බහුවිධ සංස්කෘතිය සමාජය තුළ චින්තන නිදහස
- වර්තමාන ශ්‍රී ලාංකේය සමාජයේ චින්තන නිදහස

# හැඳින්වීම - ශ්‍රී ලාංකේය සමාජය

- යක්ෂ, නාග, දේව හා රාක්ෂ යනු ප්‍රාග් බෞද්ධ යුගයේ විසූ සිව්හෙළ නම් ආදිවාසීන් ය. උදාඃ වැදි ජනයා, මණිඅක්ඛිත, චූලෝදර හා මහෝදර, සුමන සමන් සහ
- සිංහල ජනයා ක්‍රි. පූ. 6 වන සියවස පැමිණි ඉන්දු ආර්ය විජය ආදීන්ගෙන් පැවත එයි. (බෞද්ධ/කතෝලික)
- දෙමළ ප්‍රජාව, දේශීය හා ඉන්දියන් වන අතර හින්දු, බෞද්ධ හා ක්‍රිස්තියානි
- මුස්ලිම් ප්‍රජාව - යෝනක, මැලේ
- බර්ගර් - කතෝලික
- චීන, මැලේ, ලංකා අප්‍රිකානු වශයෙන් මෙන්ම විවිධ අභිකුණ්ටික ජනවර්ග වේ.

# ස්වච්ඡන්දතාව (Freewill)

- Freewill - නියතියක් හෝ බලපෑමක් නැතිව කටයුතු කිරීමේ හැකියාව. සිය මනාපය අනුව තමන්ටම කටයුතු කිරීමේ හැකියාව. (Oxford 9th edition 539p)
- නියතිය පිළිබඳ උභතෝකෝටික තත්වය මත ස්වච්ඡන්දතාව යන්න සංකීර්ණ කාරණයක් ලෙස විග්‍රහවේ.
- චින්තන නිදහස හෙවත් නිදහස් චින්තනය ද (free thought) යනු නුවණින් විමසා බලා අදහසක් ඇතිකර ගැනීමට ඇති නිදහස යි.
- චින්තනමය වශයෙන් මෙන්ම ක්‍රියාකාරීත්වයෙන් ද දාසභාවයෙන් බැහැරවීම නිදහස යි.
- චින්තන නිදහස ඇති කල්හි ස්වච්ඡන්දතාව හෙවත් තමන්ගේ කැමැත්ත අනුව කටයුතු කරන්නට අවකාශ ඇත. එවිට වීමංසනය (Quest) නම් වූ පරීක්ෂා කිරීමේ හෙවත් විමසීමේ නිදහස හිමිවේ.

- සාම්ප්‍රදායික ආගමික, සමාජීක විශ්වාස ප්‍රතික්ෂේප කිරීම යැයි ද අදහසකි
- ආගමික කාරණයක් ලෙස විශ්වාස, ලබ්ධිය හෝ වෙනත් අධිකාරයක බලපෑමකින් තොර සිතුවිල්ල (British Dictioíry)
- චින්තන නිදහස හෝ ස්වච්ඡන්දතාව පිළිබඳ සාකච්ඡාවේදී කවර නම් කැමැත්ත ඉටුවිය යුතු ද, සියලු අභිලාශයන් ඉටුකරගැනීමේ නිදහස තිබිය යුතු ද, ආගම සදාචාරය හෝ සමාජ වටිනාකම් ඇගයීම විෂයෙහි පැවතිය යුතු ආකාරය කවරේද යන්න පුළුල්ව සාකච්ඡා වේ.
- ආගමික චින්තනයට අදාලව ක්‍රියාවේ හා ඵලයේ වගකීම, සදාචාර නිර්නායක විෂයෙහි ඇති අදාලතාව, සංස්කෘතිකමය වශයෙන් ඇති සීමාවන් හා ආකල්ප මෙන්ම පුද්ගල අභිලාශයන් අතර ස්වච්ඡන්දතාව වඩාත් සංකීර්ණ ප්‍රස්තුතයක් ලෙෂ ගැනේ.
- කෙසේ වෙතත් රටක හෝ ජන සමාජයක් පොදු තත්ත්වය සලකාගෙන එහි ස්වච්ඡන්දතාවේ ස්වභාවය සාකච්ඡා කළ හාකිය.

# ලාංකේය සමාජයේ චින්තන නිදහස

- ලාංකේය සමාජය ඓතිහාසික වශයෙන් විකාශය වූවකි. එහෙයින් ඒ ඒ අවධීන්හිදී පැවති ආගමික, සාමාජික හා දේශපාලනික බලපෑම අනුව සමාජයේ මානව ස්වච්ඡන්දතාව ඇගයූ අයුරු හඳුනාගත හැකිය.
- ප්‍රාග් මහින්ද යුගයේ මෙරට විවිධ ආගමික විශ්වාස අනුගමනය කළ ජනකණ්ඩායම් පැවතියේ ය. බ්‍රාහ්මණ, ආජීවක, නිගණ්ඨ හා බෞද්ධ ආදී ආගම් මෙන්ම වෙනත් ප්‍රාථමික විශ්වාස පිළිගත් අය ඒ අතර විය. මහාවංශය අනුව බල අරගල මිස වෙනත් ගැටුමකින් තොරව ඔවුනොවුන් ක්‍රියා කළ අයුරු දැකගත හැකිය.
- මහින්දාගමනය තුළින් ලංකාවේ ආගමික දේශපාලනික හා සමාජීය ක්‍රමයට මගපෙන්වීමක් ලැබී තිබේ. එහෙත් පැවති ආගමික විශ්වාස හෝ වෙනත් ජන කණ්ඩායම් මර්ධනය කිරීමක් වී නොමැත. (මහාවංශය 17, 18, 19 පරි)

- විවිධ ආගමික විශ්වාස එලෙසම පවතින්නට හා ඇදහීමට අවකාශ ලැබීම
- බුදුදහමට අනුව ඇතැම් ප්‍රාථමික විශ්වාස වෙනුවට වෙනත් ආදේශක හඳුන්වාදීම
- අවිහිංසාවාදී ප්‍රතිපත්ති අගය කිරීම
- වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි යන සංකල්පය යටතේ කෘෂිආර්ථිකය, ධර්මය, මහජනතාව හා භික්ෂුවගේ අනුශාසනය මත සදාචාරය විසින් සමාජය පොෂණය වියි (ලංකා ඉතිහාසය 1 කාණ්ඩය I භාගය)
- පොළොන්නරු යුගයේදී හින්දු ආභාසයෙන් පංසල හා කොවිල එකම පුදබිමක දේවාල ලෙස ස්ථාපනයවීම.
- පුදපූජා, ශබ්ද පූජා ආදී වශයෙන් සංස්කෘතික ඇතිවීම.
- ස්වාධීන රාජ්‍යයක් හා ජන කණ්ඩායමක් ලෙස කටයුතු කරන්නට හා පුද්ගල ස්වච්ඡන්දතාව ආරක්ෂා කොට නමුත් සදාචාරවත් සමාජයක් බිහිකිරීම විෂයෙහි ක්‍රියාත්මකවීම. (මහාවංශය 14, 15, 16, 17 පරි, ලංකා ඉතිහාසය 1 කාණ්ඩය II භාගය)

# සාමාජික

- සමාජය- ප්‍රාකෘත සමාජය, ගැමි සමාජය හා නාගරික සමාජය වශයෙන් වේ.
- සමාජය කුල හෝ ගොත්‍ර වශයෙන් බෙදා වෙන් කිරීමක් නොවීය. එහෙත් භාරතීය ආභාසයෙන් ජනතාව අතර කුල බෙදීමක් විය. එය බෞද්ධාගමික හෝ වෙනයම් ආගමික විශ්වාසයක් මත සිදුවූවක් නොවේ. සංස්කෘතිකමය වශයෙන් සමාජයේ මුල්බැසගත් අදහස් වේ.
- එහෙත් අධ්‍යාපනික ආගමික හෝ සමාජීය වරප්‍රසාදවලට හිමිකම් කීම සඳහා එහි ආගමික හෝ දේශපාලනික නීතිමය මැදිහත්වීමක් නොවේ.
- ආවාහ-විවාහ සම්බන්ධයෙන් සංස්කෘතිකමය වූ ආකල්ප අනුව සීමා චාරිත්‍ර-වාරිත්‍ර ආදියෙන් සමන්විත විය.
- සමාජජීවිතය හා බැඳුන සියලු දේම පාහේ පවුල, කුලය, ගෝත්‍රය මත පදනම් වූ සමාජ ක්‍රමයක් තුළ ක්‍රියාත්මක වූ අතර සියලු සීමාවන් හෝ වරප්‍රසාද ඒ අනුව තීර්ණය විය.

# දේශපාලනය

- රාජාණ්ඩු පාලන ක්‍රමයක් ක්‍රියාත්මක විය.
- වැඩවසම් ලක්‍ෂණ පැවති නමුත් අපරදිග හා ඉන්දියාව වැනි පෙරදිග තමන් වහල් සමාජ ක්‍රමයක් නොවීය.
- ගම්සභාක්‍රමය තුළ යම් සුභසාධනය හෝ ආචාරධර්ම පාලනයක් පැවති නමුත් ඒවා ගෝත්‍රවාදී ප්‍රාථමික බවක් ප්‍රබලව ප්‍රකට නොකළේය
- ආගමික වශයෙන් වගකීම් (දළදා, පාත්‍රා ධාතු) දරන්නෙකු මෙන්ම ගුණවත් අයෙකු රජවීම (නොබොසත්හු රජ නොවම්හ) අගය කොට තිබේ.
- මාඝාත ආඥාව පැනවීම
- රාජාවලියෙහි විවිධ පාලකයින් රාජාණ්ඩුවක දුර්වලතා ප්‍රකට කරමින් නිදහස් චින්තනයට බාධා කළ අවස්ථාවන් ද වේ (25/26-37පරි)

# අධිරාජ්‍යවාදී ආක්‍රමණ

අධිරාජයාවාදීන් පෙරදිග ආක්‍රමණය කිරීමට ප්‍රධාන අරමුණු කිහිපයකි. ඒ අතර,

ආර්ථික ලාභ ප්‍රයෝජන ගැනීම

ආගම ප්‍රචාරය කිරීම

දේශපාලන අධිකාරය ව්‍යාප්ත කිරීම ප්‍රධාන වේ.

- 1505 දී ලොරෙන්සෝ ද අල්මේදා සහ පිරිස ලංකාවට පැමිණීමත් සමග ක්‍රමයෙන් මෙරට පැවති ආගමික, දේශපාලනික, ආර්ථික හා සාමාජික පදනමට බලපෑම් එල්ල කළ අතර එමගින් පුද්ගල ස්වච්ඡන්දතාවට බලපෑම් එල්ල විය.
- ඒ වන විට මෙරට ආර්ථික කටයුතු කළ මුස්ලිම් නාවුකයින්ට පහරදීම
- බෞද්ධ, හින්දු, මුස්ලිම් ප්‍රජාවට පහරදීම

- බෞද්ධ හින්දු පූජ්‍ය හා පූජක පිරිසට තාඩන පීඩන කිරීම
- ආගමික සිද්ධස්ථාන විනාශ කිරීම
- බියගැන්වීම හෝ වරප්‍රසාද මත කතෝලික ආගමට හරවා ගැනීම
- අත්තනෝමතික හා සාහසික ලෙස පෘතුගීසි සෙබලුන් ක්‍රියාත්මකවීම
- බලහත්කාරයෙන් ආර්ථිකය හා සම්බන්ධ අනන්‍යතාවන් විනාශ කරමින් සම්පත් සූරාකෑම
- සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය විනාශ කරමින් වරප්‍රසාදලත් පිරිසක් නිර්මාණය කිරීම අරමුණු කරගත් මිෂනාරි අධ්‍යාපන ක්‍රමය සමාජගත කරවීම
- පැවති සංස්කෘතික අනන්‍යතාවන්ට එරෙහිව සංස්කෘතික වශයෙන් ආක්‍රමණය කිරීම
- සියඅධිකාරී බලයට යටත් කොට පුද්ගල ස්වච්ඡන්දතාවට අභියෝග කිරීම
- උඩරට සිංහල රජු හා සමාජය ඒ වනවිට දේශීයව කටයුතු කළ මුස්ලිම් ප්‍රජාවට පිහිට විය